UNITED NATIONS
SRI LANKA


ශ්‍රී ලංකාවේ පවතින

# හානිකර කථනය


2024 සැප්තැම්බර්


> “ පසුගිය කාලයේ ශ්‍රී ලංකාවේ පැවති මැතිවරණ, විශාල ප්‍රමාණයේ ප්‍රචණ්ඩත්වයෙන් තොරව නිදහස් හා සාධාරණ ලෙස පවත්වනු ලැබූ බව පිළිගත්තද, මැතිවරණ කාල සීමා, වෛරී ප්‍රකාශ සහ අසත්‍ය තොරතුරු ව්‍යාප්ත කිරීමට ප්‍රබල වාහකයක් වන අතර සමාජ කණ්ඩායම් අතර ආතතීන් ඇතිකිරීමට හා සහ ඇතැම් විට ඒවා ප්‍රචණ්ඩත්වය කරා විකාශනය වීමටද අවස්ථාව සපයයි. ”
>
> **අන්තෝනියෝ ගුටෙරස්**
> එක්සත් ජාතීන්ගේ මහා ලේකම්

## හානිකර කථන සම්බන්ධ ප්‍රවණතා[1]




සමාජ මාධ්‍ය තුළ පවතින හානිකර කථනයන් (වෛරී ප්‍රකාශන, දුස්/සාවද්‍ය තොරතුරු, හිරිහැර කිරීම්, සහ පෙළඹවීම්), පසුගිය වසරේ පළමු මාස අට හා සසඳන විට, 2024 වර්ෂයේදී 32% කින් අඩුවීම නිරීක්ෂණය කල හැක. මේ අඩු වීමට ප්‍රධාන වශයෙන් බලපෑ හේතුවක් ලෙස වාර්ගික සහ ආගමික සුළුතරයන් ඉලක්ක කරගත් හානි කථන 52% ක අඩුවීම හඳුනා ගතහැක. [2]




ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු ආරම්භයත් සමඟ සංකලනය වෙමින්, දුස්/සාවද්‍ය තොරතුරු හානිකර කථන ප්‍රවණතා ජූලි සිට අගෝස්තු දක්වා පස් ගුණයකින් වැඩිවී ඇත.

ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව පවා ජනවාර්ගික හා ආගමික පදනම් මත සිදු කරන වෛරී ප්‍රකාශ පවතින්නේ අඩු මට්ටමකිනි. මෙයට ප්‍රධානතම හේතුවක් ලෙස, සියලුම ප්‍රධාන අපේක්ෂකයන්, සියලු ප්‍රජාවන් නියෝජනය කරන ඡන්දදායකයින්ගේ සහය හා ඡන්දය වෙනුවෙන් සටන් කිරීම හඳුනා ගත හැක.

සමස්තයක් ලෙස හානිකර අන්තර්ගතයන් පිළිබඳ ධනාත්මක ප්‍රවණතා තිබියදීත්, කාන්තාවන් සහ ගැහැණු ළමයින් ඉලක්ක කරගත් හානිකර අන්තර්ගතයන් නැවත නැවතත් සමාජ මාධ්‍ය තුළ දක්නට ඇත. 2024 දී වාර්තා කරන ලද සියලුම හානිකර අන්තර්ගතයන්ගෙන් 45% කට ආසන්න ප්‍රමාණයක් කාන්තාවන් හා ගැහැණු ළමයින් ඉලක්ක කරගෙන සිදු වී ඇත.

එළැඹෙන ජනාධිපතිවරණයට කිසිඳු කාන්තා අපේක්ෂිකාවන් ඉදිරිපත් වී නැතත්, 2024 අගෝස්තු මාසයේදී වාර්තා කරන ලද සියලුම හානිකර අන්තර්ගතයන්ගෙන් 53% ක් කාන්තාවන් ඉලක්ක කර ඇති අතර, එයින් වැඩි ප්‍රමාණයක ඉලක්ක වී ඇත්තේ කාන්තා දේශපාලනඥයන් සහ ප්‍රසිද්ධ පුද්ගලයින් ය.

1. ෆේස්බුක්, යූ ටියුබ් සහ ටික්ටොක් අධීක්ෂණය මත පදනම්ව එක්සත් ජාතීන්ගේ සිවිල් සමාජ හවුල්කරුවෙකු විසින් එකතු කරන ලද දත්ත වලට අනුව.
2. ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය සාවද්‍ය තොරතුරු සහ වැරදි තොරතුරු ආබියාන ස්වාධීනව අධීක්ෂණය කිරීම සඳහා විශ්වාසදායක බාහිර කරුණු පරීක්ෂකයින් මත විශ්වාසය තබයි. ධාරිතා සීමාවන් අධීක්ෂණය කිරීම හේතුවෙන් අන්තර්ජාලයේ පවතින සත්‍ය සාවද්‍ය තොරතුරු අන්තර්ගතය වැඩි වීමට ඉඩ ඇත.

## හවුල්කාර කණ්ඩායම් විසින් වාර්තා කරන ලද හානිකර කථන සංඛ්‍යා හා සමාජ මාධ්‍ය වේදිකා වලින් ලද ප්‍රතිචාර

| | ප්‍රතිචාර අනුපාතය | ඉවත් කිරීමේ අනුපාතය |
|---|---|---|
| TikTok | 83.6% | 79.6% |
| Facebook | 79.6% | 48.4% |
| YouTube | 36.8% | 19.7% |

## පසුගිය සමයේ වාර්තා වූ දුස්තොරතුරු කිහිපයක්

පසුගිය මැයි මාසයේදී එළැඹෙන ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණය පිළිබඳව එක්සත් ජාතීන්ගේ සරණාගතයින් සඳහා වූ මහ කොමසාරිස් කාර්යාලය විසින් කරන ලද බව හැඟවෙන සමීක්ෂණයක් පාදක කරගනිමින් සිදු කල බව හඟවමින් ජනතාව නොමග යැවීමට සැකසු වාර්තාවක් සමාජ මාධ්‍යවල හුවමාරු විය.



Fact check

ජනාධිපතිවරණයේදී නිශ්චිත අපේක්ෂකයකුගේ ජයග්‍රහණය පිළිබඳව රහසිගත ඉන්දීය රාජ්‍ය තාන්ත්‍රික කේබලයක තොරතුරු බව පවසමින් පෝස්ටුවක් අගෝස්තු මාසයේදී පල විය. පසුව එම තොරතුරු ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.



Fact check

යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකා ජනාධිපතිවරණය සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කළ බවට සාවද්‍ය තොරතුරු සමාජ මාධ්‍ය ඔස්සේ පසුගිය ජූලි මාසයේදී හුවමාරු විය. පසුව එම තොරතුරු යුරෝපා සංගමය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.



Fact check

සැප්තැම්බර් 5 වැනිදා තැපැල් ඡන්ද විමසීම ආරම්භ වූ මොහොතේ සිටම විවිධ අපේක්ෂකයින් ලබාගත් ඡන්ද ප්‍රමාණ ලෙස හැඟෙන පරිදී සමාජ මාධ්‍යවල පෝස්ටු සංසරණය විය. තැපැල් ඡන්ද ගණන් කිරීම සැප්තැම්බර් 21 සවස් වරුවේ ආරම්භ වන්නේ ජනාධිපතිවරණයේ ඡන්ද විමසීම අවසන් වූ පසුව පමණි.



Fact check

## හානිකර කථන වලට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?

යම් තොරතුරක් අසත්‍යයක් හෝ තව කෙනෙක්ට හානිකර බව දැනගත් වහාම එම කථනයෙන් දුරස් වන්න.

තොරතුරු බෙදා හැරීමට පෙර එහි සත්‍ය අසත්‍යතාවය සොයා බලන්න.

නිවැරදි තොරතුරු බෙදා හරින්න. දුස්/සාවද්‍ය තොරතුරු වලට එරෙහි වන්න.

